# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1164/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 15/07/2024
පැය 1335

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. කේරළ ගංජා සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කිළිනොච්චිය කඳවුර .**

2024.07.14 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කිළිනොච්චිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කිළිනොච්චිය පොලිස් වසමේ වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 01 ග්‍රෑම් 395ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කිළිනොච්චිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42ක් වන කිළිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** කිළිනොච්චිය පොලිස් ස්ථානය මඟින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. නීති විරෝධී මත් පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුර.**

2024.07.14 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එරාවූර් පොලිස් වසමේ දුම්රියපොල පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර නීති විරෝධී මත් පෙති 40ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන එරාවූර් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වූ එරාවූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** එරාවූර් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. නිති විරෝධි මත් පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කලවංචිකුඩි කඳවුර.

2024.07.14 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කලවංචිකුඩි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එරාවූර් පොලිස් වසමේ වෙයාමන් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර නිති විරෝධි මත් පෙති 180 ක් සන්තකයේ තබාගෙන යතුරු පැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන එරාවූර් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** එරාවූර් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. අනවසරයෙන් රජයේ කැළෑ ප්‍රදේශයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුර.

2024.07.14 වන දින උදේ කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හොරොව්පතාන පොලිස් වසමේ මොටගෝනෑව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර රජයේ කැළයක අක්කර ½ ක භූමි ප්‍රමාණයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන හොරොව්පතාන අඩවි වන කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 50 හා 60 වයස් වල පසුවන හොරොව්පතාන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** හොරොව්පතාන අඩවි වන කාර්යාලය විසින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. රජයේ කැළයක භූමි ප්‍රමාණයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුර.

2024.07.14 වන දින දිවා කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හොරොව්පතාන පොලිස් වසමේ තිත්තියාදිගිලිය ප්‍රදේශයේ වැටලීමක් සිදු කර තිත්තියාදිගිලිය රජයේ කැළයක අක්කර 01 ක භූමි ප්‍රමාණයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට ගෙන හොරොව්පතාන අඩවි වන කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 48,44, 27 හා 57 වයස් වල පසුවන මොරකෑව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** හොරොව්පතාන අඩවි වන කාර්යාලය විසින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 06. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ට්‍රැක්ටර් රථයක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුර.

2024.07.14 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හොරොව්පතාන පොලිස් වසමේ අඹගස්වැව ප්‍රදේශයේදී  වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින්  සිටි සැකකරුවෙකු ට්‍රැක්ටර් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන හොරොව්පතාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ** හොරොව්පතාන **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** හොරොව්පතාන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**